# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1758/35 - 2012 මැයි 18 වැනි සිකුරාදා - 2012.05.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී—බී/19/78.

**1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත**

1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 5 වන වගන්තියේ (3) වන උපවගන්තිය සමග කියවිය යුතු, ඒ පනතේ 61 වන වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝගය.

රවුෆ් හකීම්,
අධිකරණ අමාත්‍ය.

2012 මැයි මස 15 වන දින,
කොළඹ දී ය.

නියෝගය

1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 5 වන වගන්තියේ (3) වන උපවගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 61 වන වගන්තිය යටතේ සාදන ලදුව 1979 ජූලි මස 02 වන දින අංක 43/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දා වූ සහ කලින් කල සංශෝධනය කරන ලද්දා වූ නියෝගය, එකී නියෝගයේ උපලේඛනයේ I වන තීරුවේ සඳහන් ''යාපනය'' යන සටහන සහ ඊට අනුරූපීව II වන තීරුවේ ඇති සටහන වෙනුවට, පහත සඳහන් සටහන ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

| *I වන තීරුව* | *II වන තීරුව* |
|---|---|
| යාපනය | යාපනය<br>ගුරුනගර් |

06-212/1

---

එල්.ඩී—බී/19/78.

**1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත**

1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 60 වන වගන්තිය සමග කියවිය යුතු, ඒ පනතේ 61 වන වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් අග්‍රවිනිශ්චයකාරවරයාගේ එකඟත්වය ඇතිව සාදන ලද නියෝගය.

රවුෆ් හකීම්,
අධිකරණ අමාත්‍ය.

2012 මැයි මස 15 වන දින,
කොළඹ දී ය.

1A - G 16046 — 385 (2012/05)

නියෝගය

1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 61 වන වගන්තිය යටතේ සාදන ලදුව, 1979 ජූලි මස 02 වන දින අංක 43/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ සහ කලින් කළ සංශෝධනය කරනු ලැබූ නියෝගය, එහි උපලේඛනය පහත සඳහන් පරිදි සංශෝධනය කිරීම මගින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

(1) ඒ උපලේඛනයේ I වන තීරුවේ සහ II වන තීරුවේ දැක්වෙන "කඩුවෙල මහෙස්ත්‍රාත් අධිකරණය" යන්නට අදාළ වූ සටහන්වලට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

| | |
|---|---|
| "යාපනය මහෙස්ත්‍රාත් අධිකරණය | යාපනය, පේදුරුතුඩුව, චාවකච්චේරිය, මල්ලාකම් සහ කයිට්ස් අධිකරණ කොට්ඨාශ තුළ,<br><br>(අ) (23 වන අධිකාරය වූ) ළමයින් හා තරුණ තැනැත්තන් පිළිබඳ ආඥාපනත යටතේ පැන නගින්නා වූ ; සහ<br><br>(ආ) දණ්ඩ නීති සංග්‍රහය යටතේ හෝ තත්කාලයේ බලාත්මකව පවතින වෙනත් යම් නීතියක් යටතේ වූ වරදක් හේතුවෙන් හෝ එවැනි වරදකට අනුකූලව හෝ පැන නගින්නා වූ (23 වන අධිකාරය වූ) ළමයින් හා තරුණ තැනැත්තන් පිළිබඳ ආඥා පනතින් අර්ථ නිරූපනය කරනු ලැබ ඇති පරිදි ''ළමයකු'' හෝ ''තරුණ තැනැත්තකුට'' එරෙහිව හෝ ''ළමයකු'' හෝ ''තරුණ තැනැත්තකු'' සම්බන්ධයෙන් සිදුකරනු ලබන<br><br>සියලු නඩු, නීති කෘත්‍ය සහ කාරණා ; සහ |

(2) එකී උපලේඛනයේ I වන තීරුවේ සහ II වන තීරුවේ දැක්වෙන ''යාපනය, පේදුරුතුඩුව, චාවකච්චේරිය, මල්ලාකම් සහ කයිට්ස් මහෙස්ත්‍රාත් අධිකරණය" යන්නට අදාළ යම් සටහන් අත්හැර දැමීමෙන්.

06-212/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.